ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.06.03

ආර්.ආර්.ආර්.බී.පී.ඩබ්.ටී.පී. බණ්ඩාර
අංක 179, දමුන්නරුව,
දමනේවෙල, දෙහිඅත්තකණ්ඩිය.

**පැමිණිලිකාර පාර්ශවය**

එම්. ගිහංසි සත්සරි පෙරේරා
අංක 179, දමුන්නරුව,
දමනේවෙල, දෙහිඅත්තකණ්ඩිය.

**වින්දිත පාර්ශවය**

1. ආර්.එම්.පී. සුදර්ශනී
   පාසල් ගුරු,
   අම්/දෙහි/දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලය,
   දෙහිඅත්තකණ්ඩිය.
   (වර්තමාන සේවා ස්ථානය: අම්/දෙහි/වැවගම
   ප්‍රාථමික විද්‍යාලය)

2. ප්‍රියංක බණ්ඩාර පුරනේගෙදර
   විදුහල්පති (හිටපු),
   අම්/දෙහි/දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලය,
   දෙහිඅත්තකණ්ඩිය.
   (වර්තමාන සේවා ස්ථානය: අම්/දෙහි/ සේරුපිටිය
   ප්‍රාථමික විද්‍යාලය)

3. විදුහල්පති,
   අම්/දෙහි/දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලය,
   දෙහිඅත්තකණ්ඩිය.

4. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
   කලාප අධ්‍යාපන කාර්යාලය,
   දෙහිඅත්තකණ්ඩිය.

**වගඋත්තරකාර පාර්ශවය**

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංකය :- HRC/TRM/50/2025**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය වන ආර්.ආර්.ආර්.බී.පී.ඩබ්.ටී.පී. බණ්ඩාර යන අය විසින් 2025.03.20 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් තමාගේ දරුවා වන එම්. ගිහංසි සත්සරී පෙරේරා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය හට වයස අවුරුදු 09ක් වන බවත්, එම දරුවා අම්/දෙහි/දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ 4A ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන බවත් දන්වා ඇත. එසේම, තම දරුවා 2024.04.29 වන දින සිට එවකට ඇය ඉගෙනුම ලැබූ 3B පන්තියේ පන්තිභාර ගුරුවරිය වූ ආර්.එම්.පී. සුදර්ශනී නම් ගුරුවරිය විසින් වාචික හිංසනයට හා අවමන් සහගත සැලකිල්ලට ලක් කර ඇති බවත්, දරුවාට විවිධ බාහිර ක්‍රියාකාරකම් වලට දක්ෂතාව ඇතත් එම ගුරුවරිය විසින් උපක්‍රමශීලීව දරුවාට එම ක්‍රියාකාරකම් සඳහා අවස්ථා ලබා නොදීම සිදුකර ඇති බවත් පැමිණිලිකාර පාර්ශවය සඳහන් කර ඇත. මාස 11ක පමණ කාලයක සිට එකී ගුරුවරිය ඉහත ආකාරයෙන් කටයුතු කිරීම හේතුවෙන් තම දරුවා පාසල් අධ්‍යාපනය දැඩිසේ ප්‍රතික්ෂේප කළ බවත්, මේ වන විට දරුවා මානසික ආතතිය නම් රෝගී තත්ත්වයෙන් පෙළෙන බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත. එසේ වීමට පහත සඳහන් කරුණු හේතු වී ඇති බව ද පැමිණිලිකාර පාර්ශවය විසින් වැඩිදුරටත් දක්වා ඇත.

1. අදාළ ගුරුවරිය ඉතා සැර පරුෂ ලෙස දරුවන් සමඟ කටයුතු කිරීම,

2. හරකා, බූරුවා, බල්ලා, මී හරකා, තමුසේ, උබ, ගොනා, මොලේ නැති හරක්, ගොන් අම්මලාගේ ගොන් ළමයි, ලෙස දරුවන්ට නිතර බැන වැදීම,

3. තම දරුවා පන්තියේදී අසන ප්‍රශ්න වලට පිළිතුරු දුන් විට "තමුසේ දන්නවනේ තමුසේ කටවහගන්නවකො" ලෙස ඇයව ප්‍රතික්ෂේප කිරීම,

4. තම දරුවාගේ ගණිත පොතක් පන්තියේ වෙනත් ළමයකු රැගෙන ගොස් එය ගෙනවිත් දී නොමැති අවස්ථාවක දරුවා ළඟ පොත නොමැති බව දැන සැරපරුෂ ලෙස බැන වැදීම,

යන සිදුවීම් සිදුව ඇති බවත් සඳහන් කර ඇත. මෙම තත්ත්වයන් මත ඉතා ආදරණීයව කීකරුකමින් සිටි තම දරුවා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) 2024.05.05 දින වන විට ඉතා ප්‍රචණ්ඩකාරී හැසිරීම් රටාවක් පෙන්වමින් නිතර හැඩීමටත්, රණ්ඩු සරුවල් ඇති කරගැනීමටත් කටයුතු කළ බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, තම දරුවා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) නිතර තනිව කියවමින් කඳුලු සලමින් සිටි බවත්, දරුවා ඇයගේ බඩ, ඔළුව, පපුව, අත් පා රිදෙන බව විටින් විට පවසා හඬා වැටෙන්නට වූ බවත්, එබැවින් දරුවාව දෙහිඅත්තකණ්ඩිය රෝහල වෙත රැගෙන යාමෙන් පසුව එහි මනෝ වෛද්‍යවරයා වෙත ප්‍රතිකාර සඳහා යොමුකළ බවත්, එම වෛද්‍යවරයා තමාගෙන්ද කරුණු විමසා තම දරුවා විශාදය

රෝගයේ මූලික ලක්ෂණ පෙන්නුම් කරන බව දැන්වූ බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් පවසා ඇත. එසේම, එකී මනෝ වෛද්‍යවරයා විසින් අදාළ රෝගී තත්ත්වය බාහිර බලපෑම් හේතුවෙන් සිදුව ඇති බැවින් ඖෂධ වලට නොයා පරිසරය වෙනස්කර ගැටලුව විසඳාගන්නා ලෙස උපදෙස් දුන් බැවින් තම දරුවා අධ්‍යාපනය ලබන පාසලේ විදුහල්පතිට දන්වා තම දරුවා 3B පංතියෙන් 3A පන්තියට මාරුකරගත් බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත.

එසේ වුවද අදාල ගුරුවරිය දිගින් දිගටම දරුවා වාචික හිංසනයට ලක් කර ඇති බවත්, එම තත්ත්වය මත දරුවාගේ විශාදය රෝග තත්ත්වය ද වැඩිවීම හේතුවෙන් කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලට ඇතුළත් කර නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත්, මේ වන විටත් සායන සඳහා සහභාගී වන බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

**1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අයගේ කරුණු දැක්වීම**

1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් ලිඛිත ප්‍රකාශයක් 2025.06.04 දින කොමිෂන් සභාව වෙත ලබාදී ඇත.

එකී ප්‍රකාශය මගින් තමා වසර 27ක කාලයක් ප්‍රාථමික ගුරුවරියක ලෙස පාසල් 04ක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී ඇති බවත්, ගුරු පුහුණුව ලැබූ තමා සිසුන් දහස් ගණනක් සමඟ කටයුතු කළ අත්දැකීම් බහුල ගුරුවරියක් බවත්, තම රාජකාරි වසර 27 තුළදී තමා සැරපරුෂ ලෙස හෝ දරුවන්ට නොමනා අයුරින් වධහිංසා කරන අයෙක් ලෙස ප්‍රකට වී නොමැති බවත්, තම පෞද්ගලික ලිපි ගොනුවටද එවැනි චෝදනා ලැබී නොමැති බවත් සඳහන් කර ඇත.

එසේම, 2024.01.27 දින තමා පන්තිභාරකාරත්වය දැරූ 3B ශ්‍රේණියට ගිහංසි දැරිය (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) ඇතුළත් වූ බවත්, තමා සියලු දරුවන්ට අවස්ථා ලබා දෙමින් පසුපෙළ සිසුන්ද ඉදිරිපෙළට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ බවත් 1 වන වගඋත්තරකාරිය විසින් ප්‍රකාශ කර ඇත. එසේම, කිසිදු අවස්ථාවක ගිහංසි දැරිය (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) තමා විසින් වාචික හිංසනයකට ලක් නොකළ බවත්, එක් දිනක් ගිහංසි දැරියගේ ගණිතය පොත වෙනත් ළමයෙකු රැගෙන ගොස් ගෙනවිත් නොදුන්විට වෙනත් පොතක අවසන් පිටුවක වැඩ කරන ලෙස තමා එම දැරියට පැවසූ බවත්, ඇයගේ පොත ගෙනවිත් දෙන ලෙස පන්තියේ ළමයින්ගේ දෙමව්පියන්ගේ WhatsApp සමූහයට පණිවිඩයක්ද යොමුකළ බවත්, ගිහංසි දැරියගේ මවගේ චෝදනා තමා දැනගත්තේ 2024.05.21 දින බවත්, ඊට පෙර ඒ පිළිබඳව තමා හෝ විදුහල්පතිවරයා දැනුවත් නොකළ බවත් 1 වන වගඋත්තරකාරිය විසින් දක්වා ඇත.

එසේම, විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ළමුන් තෝරාගැනීමේදී තමා ගිහංසි දැරියට (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) බලපෑම් නොකළ බවත්, ගිහංසි දැරිය 2024 වසර පුරාවට වාර විභාග

තුනෙන්ම ඉහළ ලකුණු ලබා ඇති බවත්, ඇය 2024.02.19 සිට 2025.02.20 තෙක් පාසල තුළ කිසිදු චර්යාමය ලක්ෂණ වල වෙනසක් පෙන්වා නොමැති බවත් 1 වන වගඋත්තරකාරිය විසින් දන්වා ඇත. එසේම, තමා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පරිබාහිරව සාමදාන විනිසුරුවරියක ලෙස ද, දහම් පාසල් ගුරුවරියක ලෙස ද, ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම්වරියක ලෙසද කටයුතු කරන බව 1 වන වගඋත්තරකාරිය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**<u>2 වන වගඋත්තරකාර අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ හිටපු විදුහල්පති ප්‍රියංක බණ්ඩාර පුරනේගෙදර යන අයගේ කරුණු දැක්වීම</u>**

2 වන වගඋත්තරකාර අම්/ දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරයා වන ප්‍රියංක බණ්ඩාර පුරනේගෙදර යන අය විසින් 2026.04.22 වන දින කොමිෂන් සභාව වෙත දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, තමා 2019.11.06 වන දින අම්/ දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති ලෙස පත්වී රාජකාරි භාරගන්නා ලද බවත්, එම අවස්ථාව වන විට පාසල් සංවර්ධන සමිතියේ ලේකම් ලෙස කටයුතු කරනු ලැබුවේ පැමිණිලිකාරිය වන ආර්.ආර්.ආර්.බී.පී.ඩබ්.ටී.පී. බණ්ඩාර මහත්මිය වන බවත් ය.

පැමිණිලිකාරියගේ දෙවන දියණිය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දැරිය 2 ශ්‍රේණිය අවසන් කර 2024 වර්ෂයේ 3 ශ්‍රේණියට ඇතුලත් වූ අතර එම පන්තියේ පන්තිභාරකාරිත්වය ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය) වෙත පවරා තිබූ බවත්, පැමිණිලිකාරිය විසින් 2024 වර්ෂයේ පෙබරවාරි මාසයේ දිනක (දිනය නිශ්චිත ලෙස මතක නැත) දුරකථනයෙන් කතාකර මෙම පැමිණිල්ලේ සඳහන් පරිදි පැමිණිලිකාරියගේ දියණිය සහ ආර්.එම්.පී. සුදර්ශනී ගුරු මහත්මිය අතර ඇතිව තිබූ ගැටළුකාරී තත්ත්වය පිළිබඳ තමා දැනුවත් කළ බවත්, එම අවස්ථාවේ දී තමා පොදුවේ ගුරුවරුන් සියලු දෙනා උදෑසන රැස්වීම අවසානයේ කැඳවා දරුවන්ට ප්‍රියමනාප හා ආදරණීය ගුරුවරුන් ලෙස සතුටින් වැඩ කරන ලෙස දැනුවත් කළ අතර අදාළ ගුරුවරිය ඉලක්ක කරගෙන දැනුවත් කිරීමක් සිදු කරනු නොලැබූ බවත් 2 වන වග උත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම, ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය) පිළිබඳ මීට පෙර අවස්ථාවකදී ද දරුවන්ට සැර පරුෂ ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීම පිළිබඳ පැමිණිලි ලැබී තිබූ බවත්, එම අවස්ථාවලදී මෙම ගුරුතුමියට පෞද්ගලිකව අවවාද කරන ලද බවත් 2 වන වගඋත්තරකරු විසින් දක්වා ඇත.

තවද, 2024.05.05 වන දින ( දිනය නිශ්චිත ලෙස මතක නැත, පාසලේ නිල සටහන් පොතේ සටහනක් යොදා ඇත) පැමිණිලිකාරිය විසින් ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය)ට එරෙහිව චෝදනා පත්‍රයක් සහ පැමිණිලිකාරියගේ දෙවන දියණිය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) දැරියගේ වෛද්‍ය සහතිකය තමා වෙත

ඉදිරිපත් කර අදාළ දැරිය 3- B පන්තියේ සිට 3- A පන්තියට මාරු කරන ලෙස සිදු කරනු ලැබූ ඉල්ලීම සලකා බලා එම දරුවා එදින සිට 3- A පන්තියට මාරු කළ බවත්, එලෙස මාරු කිරීමෙන් අනතුරුව 3- A පන්තියේ ගුරුවරිය පෞද්ගලිකව කැඳවා පැමිණිලිකාරියගේ දෙවන දියණිය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) දැරිය දැනට සිටින තත්ත්වය පිළිබඳව දැනුවත් කර වගකීමෙන් කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුන් බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

කෙසේවෙතත් මෙම සිදුවීම දරුවා සහ ගුරුවරිය අතර සිදු වූ සිදුවීමකින් ඔබ්බට ගොස් දෙමාපියන්-දෙමාපියන් හා දෙමාපියන් - ගුරුවරුන් අතර ගැටුමක් බවට පත් වූ බවත්, විශේෂයෙන් ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය)ට හිතවත් දෙමාපියන් පිරිසක් සහ විරුද්ධ පිරිසක් ලෙස කාණ්ඩායම් දෙකක් බිහි වූ බවත්, මේ කාරණය සඳහා ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය)ගේ අත පෙවීම හා උඩගෙඩි දීම සිදුවන බව පෙනී ගිය බවත්, අවසානයේ එය පාසල් අභ්‍යන්තර ගැටුමක් ලෙස දුරදිග ගොස් දෙහිඅත්තකණ්ඩිය කලාප අධ්‍යාපන කාර්යාලය මගින් විමර්ශනයක් ද සිදු කරන ලද බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. එසේම, එම විමර්ශනයේදී දෙහිඅත්තකණ්ඩිය කලාප අධ්‍යාපන කාර්යාලය මගින් මගින් ගුරුවරියගේ ගැටලුවක් නොමැති බව හා දරුවා පන්තිය මාරු කිරීම නිවැරදි තීරණයක් බව සඳහන් කර ගැටලුව දුර දිග නොයවා විසඳා ගැනීමට පොදුවේ උපදෙස් ලබා දුන්නද, දෙමාපිය පාර්ශව දෙක අතර ඇති වූ ආරවුල දිගින් දිගටම වර්ධනය වූ බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

මෙලෙස කලාප අධ්‍යාපන කාර්යාලයෙන් සිදු කරනු ලැබූ විමර්ශනය සාධාරණ නැතැයි ප්‍රකාශ කරමින් පැමිණිලිකාරිය විසින් ජාතික ළමා රක්ෂණ අධිකාරිය වෙත ද පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්, ඊට අදාළව ජාතික ළමා රක්ෂණ අධිකාරිය විසින් පාසල් අභ්‍යන්තර විමර්ශනයක් සඳහා අවශ්‍ය ප්‍රකාශ ලබා ගැනීමක් සිදු කළ බවත්, ජාතික ළමා රක්ෂණ අධිකාරියේ නිලධාරියෙකු විසින් පාසලේ ගුරුභවතුන් සියලුම දෙනා පොදුවේ දැනුවත් කිරීමක් ද සිදු කරන ලද බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

එසේම දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානය මගින් ද මීට අදාළ ව විමර්ශනයක් සිදු කළ බවත් , තමා ද ඒ සඳහා කැඳවනු ලැබූ බවත්, එහි දී ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය) සහ පැමිණිලිකාරිය අතර එකඟතාවයක් ඇති වූ බවත්, නැවත මෙම ගැටලුව දුර දිග නොයවා සාමාන්‍ය පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දුන් බවත්, ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය) හා එම්. ගිහංසි සත්සරී පෙරේරා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) දැරිය කතා කර සාමාන්‍ය පරිදී කටයුතු කිරීමට එකඟ වූ බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, 2024 දෙසැම්බර් මාසයේ දී තූර්ය වාදක කණ්ඩායම සඳහා සිසු දරුවන් තෝරා ගැනීමේ දී එම්. ගිහංසි සත්සරී පෙරේරා (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) දැරිය ඒ සඳහා තෝරාගන්නවාට අනෙක් දරුවන්ගේ මව්වරු අකමැති බවත්, යම්හෙයකින් එම දැරිය තෝරාගතහොත් තමාට ගැටලුවක් ඇති විය හැකි බවත් ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය) විසින් තමා වෙත දුරකථනයෙන් දැනුම් දුන් බවත්, එම අවස්ථාවේ දී එම දැරිය ඒ සඳහා සුදුසු නම් ඇයට අවස්ථාව ලබා දෙන ලෙස තමා ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මියට උපදෙස් ලබා දුන් බවත්, එහෙත් ආර්.එම්. පී. සුදර්ශනී ගුරු මහත්මිය තම උපදෙස් පවා නොතකා කටයුතු කිරීම හේතුවෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ද ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කළ බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේම, 2025.01.06 වන දින සිට තමා අම්/ දෙහි/ සේරුපිටිය ප්‍රාථමික විද්‍යාලයේ රාජකාරී භාරගත් බවත්, ඉන්පසුව සිදු වූ සිදුවීම් පිළිබඳව තමා දැනුවත් නොමැති බවත් 2 වන වගඋත්තරකරු විසින් දක්වා ඇත.

<u>**3 වන වගඋත්තරකාර අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ වර්තමාන විදුහල්පති ටී.එම්.ඩබ්.කේ. තෙන්නකෝන් යන අයගේ කරුණු දැක්වීම**</u>

3 වන වගඋත්තරකාර අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ වර්තමාන විදුහල්පති ටී.එම්.ඩබ්.කේ. තෙන්නකෝන් මහතා කොමිෂන් සභාවේදී කරුණු දක්වමින් තමා 2025.01.06 දින අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයට පැමිණි බවත්, මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ගිහංසි දැරියගේ මව (මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය) විසින් පාසල් තූර්යවාදක කණ්ඩායමට තම දරුවා බඳවා ගන්නා ලෙස කළ ඉල්ලීම අනුව එයට බඳවා ගත් බවත් ප්‍රකාශ කර ඇත. මෙම පැමිණිලිකාරිය පාසල් සංවර්ධන කමිටුවේ කතාවක් කිරීමට අවස්ථාව ඉල්ලුවද අනෙකුත් දෙමාපියන් එයට විරුද්ධ වීම මත ඒ සඳහා අවස්ථාව නොදුන් බව ද 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම, ගිහංසි දැරිය (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය)ට පාසලේ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා අවස්ථාවක් ලබා දී ඇති බවත්, මෙම දැරියට වෙස් සහතික 05 ක් හා පදක්කම් (මෙඩල්) 15 ක් ඇති බවත්, එම දැරිය ක්‍රීඩාවට මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම් වලටද දක්ෂ බවත් 3 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. තවද, මෙම දැරියගේ මව (මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය) විසින් එම දැරිය පාසල් නොඑවීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වී ඇති බව තමා සිතන බවත්, මෙම දැරිය සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව වෛද්‍යවරයෙකු ලෙස හඳුන්වා දුන් අයෙකු දුරකථනයෙන් සිදු කළ විමසීම අනුව දැරියගේ පන්තිය මාරු කිරීම සිදුකළ බවත් 3 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**4 වන වගඋත්තරකාර දෙහිඅත්තකණ්ඩිය කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යක්ෂවරයාගේ කරුණු දැක්වීම**

මෙම පැමිණිල්ලට අදාළව 2025.06.03 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කේ.බී. ධර්මසේන යන අය කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම සිදුවීමට අදාළ ගිහංසි දැරිය (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) මේ වන විට ආර්.එම්.පී. සුදර්ශනී ගුරුවරිය පන්ති භාරකාරත්වය දරන පන්තියේ ඉගෙනුම නොලබන බවත්, ඇය වෙනත් පන්තියක ඉගෙනුම ලබන බැවින් ගුරුවරිය වෙනත් පාසලකට මාරු කිරීමට පැමිණිල්ල මගින් සිදු කර ඇති ඉල්ලීම ගැටලු සහගත බවත් ය.

එසේම, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අංක AM/DK/Ed.Admin/2025 සහ 2025.08.12 දිනැතිව වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, මෙම සිදුවීමට සම්බන්ධ ගිහංසි දැරිය (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) පාසල් නොපැමිණෙන බවට වාර්තා වූ බැවින් ඒ පිළිබඳව සොයා බලා ආර්.එම්.පී. සුදර්ශනී ගුරුවරිය (මෙම පැමිණිල්ලේ 1 වන වගඋත්තරකාරිය) වෙනත් පාසලකට ස්ථානමාරු කිරීමට කටයුතු කළ බවත්, ඉන්පසු අංක AM/DEHI/Z/AI/G2 සහ 2025.06.04 දිනැති ලිපිය ගිහංසි දැරියගේ මව වන ආර්.ඩබ්. තිලානි ප්‍රියංකා මහත්මිය (මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය) වෙත යොමු කරමින් ගිහංසි දැරිය පාසල් ගත කරන ලෙස දැන්වූ බවත්, මේ වනවිට එම දැරිය පාසලට පැමිණෙන බව විදුහල්පතිවරයා මගින් තහවුරු කරගෙන ඇති බවත් ය.

**නිරීක්ෂණ**

මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන ආර්.ආර්.ආර්.බී.පී.ඩබ්.ටී.පී. බණ්ඩාර යන අයගේ දියණිය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා (වින්දිත පාර්ශවය) යන දැරිය මේ වන විට දෙහිඅත්තකණ්ඩිය අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ ඉගෙනුම් කටයුතු සිදුකරන බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය විසින් පැමිණිල්ල මගින් දක්වා ඇත්තේ, වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය 2024.04.29 වන දින සිට එම වර්ෂය තුළ එවකට ඇය ඉගෙනුම ලැබූ අම්/දෙහි දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ 3B පන්තිය භාරව සිටි 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී ගුරුවරියගේ වාචික හිංසනයට ලක්ව ඇති බවත්, ඒ හේතුවෙන් පාසල් යාම ද ප්‍රතික්ෂේප කළ බවත්, දැරිය හට වෛද්‍ය ප්‍රතිකාර සිදු කිරීමට පවා සිදු වූ බවත් ය.

1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ, ඇය වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය කිසිම වාචික හිංසනයකට ලක් නොකළ බවයි. කෙසේ වෙතත් මෙම සිදුවීමට අදාළව 3 වන වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අංක AM/DK/Ed.Admin/2025 සහ 2025.08.12 දිනැතිව වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, මෙම සිදුවීමට සම්බන්ධ ගිහංසි දැරිය (වින්දිත පාර්ශවය) පාසල් නොපැමිණෙන බවට වාර්තා වූ බැවින් ඒ පිළිබඳව සොයා බලා ආර්.එම්.පී. සුදර්ශනී ගුර වරිය වෙනත් පාසලකට ස්ථානමාරු කිරීමට කටයුතු කළ බවත්, ඉන්පසු අංක AM/DEHI/Z/AI/G2 සහ 2025.06.04 දිනැති ලිපිය ගිහංසි

දැරියගේ මව වන ආර්.ඩබ්. තිලානි ප්‍රියංකා මහත්මිය වෙත යොමු කරමින් ගිහංසි දැරිය පාසල් ගත කරන ලෙස දැන්වූ බවත්, මේ වනවිට එම දැරිය පාසලට පැමිණෙන බව විදුහල්පතිවරයා මගින් තහවුරු කරගෙන ඇති බවත් ය. එසේම, මෙම සිදුවීම සුපරික්ෂාකාරීව විමර්ශනය කර බැලූ විට මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය විසින් 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය සමඟ කලක පටන් ඇති කරගත් පෞද්ගලික ආරවුලක් මත මෙලෙස කටයුතු කර ඇති බවත්, කලාපීය වශයෙන් ගුරු තුලනය තුළ ඉතා අසීරු අන්දමින් කළමණාකරණය කිරීමේ දී මෙවැනි කාරණා සිදුවීම කණගාටුවට කරුණක් බවත් 3 වන වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් සිය වාර්තාව මගින් දක්වා ඇත.

තවද, මෙම සිදුවීමෙන් පසුව 2024.05.20 වන දින වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය දෙහිඅත්තකණ්ඩිය රෝහලේ මානසික සෞඛ්‍ය ඒකකයෙන් ප්‍රතිකාර ලබා ඇති බව වෛද්‍ය වාර්තා අනුව පෙනී යයි. එකී වාර්තාවෙහි වෛද්‍යවරයා දක්වා ඇත්තේ පන්තිභාර ගුරුවරිය විසින් එම දැරිය හට බැන වැදීම හේතුවෙන් ඇය බියට පත්ව ඇති බවත්, එම දැරිය උපදේශනයට යොමු කර ඇති බවත් ය. එසේම, වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය රිජ්වේ ආර්යා ළමා රෝහලින් ද ප්‍රතිකාර ලබා ඇති බව නිරීක්ෂණය වේ. වෛද්‍ය අනුරාධා හේරත් (මනෝචිකිත්සාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගෞරව උපදේශක ළමා හා නව යොවුන් මනෝචිකිත්සක, රිජ්වේ ආර්යා ළමා රෝහල) විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එම්. ගිහංසි සත්සරී පෙරේරා (වින්දිත පාර්ශවය) යන දැරියට අදාළව වෛද්‍ය වාර්තාවක් ලබා දී ඇත.

උක්ත වෛද්‍ය වාර්තාව මගින් දක්වා ඇත්තේ, පාසල් යාම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු මෙම එම්. ගිහංසි සත්සරී පෙරේරා (වින්දිත පාර්ශවය) යන දැරිය අවස්ථා දෙකකදී එනම්, 2025.04.07 වන දින සිට 2025.04.11 වන දින දක්වා හා 2025.05.15 වන දින සිට 2025.06.06 වන දින දක්වා රිජ්වේ ආර්යා ළමා රෝහලේ 19 B වාට්ටුවට ඇතුළත්ව නේවාසිකව ප්‍රතිකාර ලැබූ බවයි. එසේම, අදාළ දැරියගෙන් සහ ඇයගේ මවගෙන් දැරියගේ රෝගී ඉතිහාසය පිළිබඳව දැනගත් බවත්, එහිදී එම දැරිය ඇයගේ පන්තිභාර ගුරුවරියගේ වාචික හිංසනයට ලක්ව ඇති බවට අනාවරණය වූ බවත්, එම රෝග ඉතිහාසය හා දැරියගේ මානසික තත්ත්වය පරීක්ෂා කිරීමේදී එම්. ගිහංසි සත්සරී පෙරේරා දැරිය (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) හට විශාදය සමඟ පසු කම්පන ආතති ආබාධය (She was diagnosed to have depression with post traumatic stress disorder)ඇති බව නිරීක්ෂණය වූ බවත් සඳහන් කර ඇත. එසේම, මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා දැරියගේ රෝගී තත්ත්වය සම්බන්ධයෙන් වෛද්‍යවරියගේ මතය පහත පරිදි සඳහන් කර ඇත.

"Impression

Considering history and the mental state examination Gihansi was observed have features of severe depressive episode with post traumatic stress disorder symptoms which is

characterized by low mood, lack of energy and loss of interest in previously pleasurable activities. She also had avoidance of reminders related to previous traumatic incident. She had nightmares and hypervigilance and intrusive thoughts about the incident where she was verbally and emotionally harassed by that teacher. She also harbored strong suicidal ideation and attempts."

ඒ අනුව ඉහත කී ගුරුවරියගේ වාචික සහ මානසික හිංසනයන් හේතුවෙන් එම්. ගිහංසි සත්සරි පෙරේරා දැරිය (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) දැඩි කම්පනයකට ලක්ව ඇති බවත්, එම දැරිය හට දැඩි ලෙස සිය දිවි තොර කරගැනීමේ චින්තනයන් පහළ වී ඇති බවත්, ඇය ඒ සඳහා උත්සහයන් ද ගෙන ඇති බවත් වෛද්‍යවරිය විසින් තහවුරු කර ඇති බව පෙනී යයි.

තවද, එම දැරිය හට මනෝ වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට අමතරව ආතතියෙන් තොර පාසල් පරිසරයක කටයුතු කිරීමට අවස්ථාව සලසා දීම ද වැදගත් බවත්, නැවතත් එවැනි අවස්ථාවකට මුහුණපෑමට සිදුවුවහොත් එම දැරිය නැවත කම්පනයට පත්විය හැකි බවත් සඳහන් කර ඇත. එය පහත පරිදි වෛද්‍ය වාර්තාව තුළ දක්වා ඇත.

"Plan

She would benefit from necessary psychotherapeutic support to manage her mental health condition. It is important that Gihansi is kept at a stress-free school environment without having to experience trauma.

There is a risk of traumatization if exposed to similar situation.

She needs to be followed up by CRPO to ensure that her school environment is safe."

තවද, දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානය වෙත වයස අවුරුදු 10ක් වන එම්. ගිහංසි සත්සරි (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දැරියව දමුන්නරුව විද්‍යාලයේ පන්තිභාර ගුරුවරිය විසින් මානසික කම්පනයකට ලක්කර ඇති බවට සිදු කළ දැනුම්දීම අනුව එලෙස පාසලේ පන්තිභාර ගුරුවරිය විසින් දැරිය මානසික හිංසනයට ලක්කර කෲරත්වයට පත්කිරීම සම්බන්ධව පොලිස් ස්ථානයේ බල අපරාධ අංක 48/2025 යටතේ ලේඛන ගත කර විමර්ශන ආරම්භ කර ඇති බවත්, ඒ සම්බන්ධව දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී 478/2025 යටතේ 2025.06.06 වන දින කරුණු වාර්තා කර ඇති බවත්, එම නඩුව මේ වන විට විභාග වෙමින් පවතින බවත් නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

පැමිණිලිකාරිය විසින් ඇයගේ දියණිය වන මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරි පෙරේරා යන දැරිය 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් වාචික හිංසනයට ලක් කිරීම හේතුවෙන් එම දැරිය මානසික පීඩනයකට ලක් වූ බවත්, එබැවින් එම දැරිය හට

වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට සිදු බවත් සඳහන් කර ඇත. කෙසේවෙතත් එම චෝදනාව 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

මෙවැනි වධහිංසාවන්ට පත්වීම සම්බන්ධ පැමිණිලි වලදී වැදගත්ම සාධකයක් වන්නේ වෛද්‍ය වාර්තාවන් ය. ඒ බව **<u>ඩබ්. නන්දසේන එ. යූ.ජී. චන්ද්‍රදාස, ස්ථානාධිපති, පොලිස් ස්ථානය, හිනිදුම සහ තවත් අය</u>** [(2005) B.L.R. 104] නඩුවේ දී ශිරාණි බණ්ඩාරනායක විනිසුරුතුමිය විසින් සඳහන් කර ඇත. ("*...when there is an allegation based on violation of fundamental rights guaranteed in terms of Article 11 of the Constitution, it would be necessary for the petitioner to prove his position by way of medical evidence and/or by way of affidavits and for such purpose it would be essential for the petitioner to bring forward such documents with a high degree of certainty for the purpose of discharging his burden.*")

ඒ අනුව වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරියට අදාළව කොමිෂන් සභාව වෙත ඉදිරිපත්ව ඇති වෛද්‍ය අනුරාධා හේරත් (මනෝචිකිත්සාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගෞරව උපදේශක ළමා හා නව යොවුන් මනෝචිකිත්සක, රිජ්වේ ආර්යා ළමා රෝහල)මහත්මියගේ වාර්තාවට අනුව දක්වා ඇත්තේ, අදාළ දැරියගෙන් සහ ඇයගේ මවගෙන් දැරියගේ රෝගී ඉතිහාසය පිළිබඳව දැනගත් බවත්, එම රෝග ඉතිහාසය හා දැරියගේ මානසික තත්ත්වය පරීක්ෂා කිරීමේදී පන්තිභාර ගුරුවරිය විසින් එම්. ගිහංසි සත්සරී පෙරේරා දැරිය වාචික හිංසනයට ලක් කර ඇති බව අනාවරණය වූ බවත්, ඒ හේතුවෙන් එම දැරියට විශාදය සමඟ පසු කම්පන ආතති ආබාධය (She was diagnosed to have depression with post traumatic stress disorder) නම් රෝග තත්ත්වය ඇති බව නිරීක්ෂණය වූ බවත්, ඊට අදාළව එම දැරිය හට මනෝ වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට අමතරව ආතතියෙන් තොර පාසල් පරිසරයක කටයුතු කිරීමට අවස්ථාව සලසා දීම ද වැදගත් බවත් ය.

ඒ අනුව වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරියගේ පන්තිභාර ගුරුවරිය වූ 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් සිදු කරන ලද වාචික හිංසනය හේතුවෙන් එම දැරිය මානසික පීඩනයකට ලක්ව ඇති බවත්, ඒ හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට ද සිදුව ඇති බවත් තහවුරු වේ.

<u>ද සිල්වා එ. පොහොර සංස්ථාව</u> **(1989) 2 Sri LR 393** නඩුවේ දී අමරසිංහ විනිසුරුතුමා විසින් සඳහන් කර ඇත්තේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙහි ඇතුළත් "වධ හිංසාව හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ල නැතහොත් දඬුවම" යන්න හුදෙක් ශාරීරික ප්‍රචණ්ඩත්වට සීමා නොවන බවත්, එයට ආත්මයට හෝ මනසට අදාළව සිදුවන හිංසනයන් ද අදාළ වන බවත් ය. ("*I am of the opinion that the torture or cruel, inhuman or degrading treatment or punishment* contemplated in Article 11 of our Constitution is not confined to the realm of physical violence. It would embrace the sphere of the soul or mind as well.") මෙම නඩු තීරණය අනුව සලකා බැලීමේ දී 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙහි

විෂය පථයට මානසික හිංසනයන් ද ඇතුළත් කරමින් පුළුල් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරියගේ පන්තිභාර ගුරුවරිය වූ 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් සිදු කරන ලද වාචික හිංසනය හේතුවෙන් එම දැරිය ලක් වී ඇති මානසික පීඩනය, ඉහත නඩු තීරණය තුළින් දක්වා ඇති පරිදි 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ අදාළ කරගත හැකි බව තහවුරු වේ.

එසේම, <u>ලන්දගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ වූලංගනී එ. වරුණි බෝගහවත්ත සහ තවත් අය</u> (SC FR App No. 677/2012) නඩුවේදී අලුවිහාරේ විනිසුරුතුමා විසින් සඳහන් කර ඇත්තේ, <u>ද සිල්වා එ. පොහොර සංස්ථාව</u> **(1989) 2 Sri LR 393** නඩුවේ දී ජමීල් විනිසුරුතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ කුරිරු, අමානුෂික සහ අවමන් සහගත සැලකීමක් පිළිබඳ නිගමනයකට එළැඹීම සඳහා ඉතා බරපතල මට්ටමේ හිංසනයක් සිදුව තිබීම අවශ්‍ය වන බව (*"ill treatment per se, whether physical or mental, is not enough; a very high degree of maltreatment is required"*) සඳහන් කර තිබුණ ද, වැඩිහිටියෙකුට අදාළ වන 'බරපතල මට්ටමේ හිංසනය' පිළිබඳ නිර්ණායකය සෑම විටම බාලවයස්කරුවෙකුගේ මානසික තත්ත්වය හා සමපාත නොවන බැවින්, බාලවයස්කරුවෙකු විසින් අවමන් සහගත සැලකීම් පිළිබඳව පැමිණිලි කරන අවස්ථාවක, 'ඉහළ භාරකරු' ලෙස කටයුතු කරන අධිකරණය, අදාළ ක්‍රියාව ඉහත කී 'බරපතල හිංසන මට්ටම' සපුරා නොමැති බව පවසමින් එම පැමිණිලි ප්‍රතික්ෂේප කිරීමට හදිසි නොවිය යුතු බවත්, චෝදනා එල්ල වී ඇති ක්‍රියාව මඟින් අදාළ දරුවාගේ මානසිකත්වයට සහ වර්ධනයට සිදු වී ඇති බලපෑම පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු බවත් ය. (*"...this Court recognizes that what amounts to a 'high degree of maltreatment' in relation to an adult does not always resonate with the mental constitution of a minor. Therefore, when a minor complains of degrading treatment, the Court as the upper guardian must not be quick to dismiss the claims for failing to meet the same high threshold of maltreatment. Instead, it must carefully consider the impact the alleged treatment may have had on the mentality and the growth of the child."*)

මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරියගේ පන්තිභාර ගුරුවරිය වූ 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් සිදු කරන ලද වාචික හිංසනය හේතුවෙන් එම දැරිය දැඩි කම්පනයකට ලක්ව ඇති බවත්, එම දැරිය හට දැඩි ලෙස සිය දිවි තොර කරගැනීමේ චින්තනයන් පහළ වී ඇති බවත්, ඇය ඒ සඳහා උත්සහයන් ද ගෙන ඇති බවත් වෛද්‍යවරිය විසින් තහවුරු කර ඇති බැවින්, එකී දැරිය හට සිදුව ඇති මානසික හිංසනය 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ අදාළ කරගත හැකි බව නිරීක්ෂණය වන අතර, ඉහත නඩු තීන්දු මඟින් ද එය තවදුරටත් තහවුරු වේ.

එසේ හෙයින් 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරියහට සිදු කරන ලද වාචික හිංසනයන් හේතුවෙන් එකී දැරිය මානසික හිංසනයකට පත්ව ඇති බව වෛද්‍ය වාර්තා අනුව තහවුරු වන බැවින්, ඉහතින් සඳහන් කරන ලද නඩු තීරණයන් මගින් ද දක්වා ඇති පරිදි 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති කිසිම තැනැත්තෙකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට වන වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරියගේ මූලික අයිතිවාසිකම, 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ අන්තර්ගත ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාවට අනුව, ගුරුවරුන් යනු ශිෂ්‍යයින්ගේ ‘ස්ථානීය දෙමාපියන්’ (Loco-Parents) යන නෛතික සංකල්පයට අනුව සිසුන්ගේ සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීමට ගුරුවරුන් බැඳී සිටින බව එහි පැහැදිලිව දක්වා ඇත. එසේම, එහි 5.3 (අ) වගන්තිය අනුව ගුරුවරයෙකු විසින් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය (1989) ප්‍රකාරව ළමයින් සතු අයිතීන් (විශේෂයෙන් අධ්‍යාපනය ඇතුළුව) තහවුරු වන සේ කටයුතු කළ යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව 1989 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි ඇතුළත් සියලු අයිතිවාසිකම් දරුවන් වෙත සුරක්ෂිත කරදීමට ගුරුවරුන් විසින් කටයුතු කිරීම එකී චක්‍රලේඛ ප්‍රතිපාදනය මගින් අපේක්ෂිත ය. 1989 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 37(අ) වගන්තිය මගින් දක්වා ඇත්තේ කිසිම ළමයෙකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එබැවින් ඉහත කී අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ 5.3 (අ) වගන්තිය ප්‍රකාරව එකී අයිකිවාසිකම සුරක්ෂිත වන අයුරින් ගුරුවරුන් විසින් කටයුතු කළ යුතු ය. එහෙත් මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය, ඇයගේ පන්තිභාර ගුරුවරිය වූ 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අයගේ වාචික හිංසනයන්ට ලක්ව ඇති බව තහවුරු වී ඇත. ඒ අනුව 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය ගුරුවරියක වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ අන්තර්ගත ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාවට අනුව කටයුතු කිරීමට අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය වන අතර, ඒ හේතුවෙන් වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය හට නීතිය මගින් සුරක්ෂිත ළමා අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවකාශය අහිමි වී ඇති බව ද පෙනී යයි.

එසේම, ඉහත කී අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ 6.4 (අ) වගන්තිය අනුව ගුරුවරයෙකු විසින් තම ශිෂ්‍යයින්ගේ ආත්මාභිමානයට සහ ආත්ම ගෞරවයට හානි වීමෙන් ඔවුන් තුළ ඍණාත්මක ආකල්පයක් ඇති වීමට හේතුවන අන්දමේ ප්‍රකාශයන් කිසිම අවස්ථාවක නොකළ යුතු බවට දක්වා ඇත. මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය, ඇයගේ පන්තිභාර ගුරුවරිය වූ 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අයගේ වාචික

හිංසනයන්ට ලක්වීම හේතුවෙන් ඉතා උනන්දුවෙන් සිදු කළ පාසල් යාම පවා ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය වේ. එසේම, එලෙස හිංසනයට පත්වීම හේතුවෙන් ඇයට ඇති වූ විශාදය සමඟ පසු කම්පන ආතති ආබාධය නම් රෝග තත්ත්වය නිසා එම දැරිය එතෙක් ඉතා කැමැත්තෙන් නිරත වූ කටයුතුවල නිරත වීම ප්‍රතික්ෂේප කරන බව වෛද්‍යවරිය සිය වාර්තා තුළින් ද තහවුරු කර ඇත. ඒ අනුව 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අයගේ ප්‍රකාශයන් හේතුවෙන් වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය තුළ සෘණාත්මක ආකල්පයන් වර්ධනය වී ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත කරුණු අනුව සලකා බැලීමේ දී 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය ගුරුවරියක ලෙස අනුගමනය කළ යුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය නීතිය මගින් සුරක්ෂිත ළමා අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවකාශය අහිමි වී ඇති බැවින්, 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම ද නීතිය ක්‍රියාත්මක කිරීම ද සැම දෙනාටම එක හා සමාන විය යුතු බවට වන වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරියගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

2 වන වගඋත්තරකාර අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ හිටපු විදුහල්පති ප්‍රියංක බණ්ඩාර පුරනේගෙදර යන අය විසින් මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය සහ 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන ගුරුවරිය ඇති වූ ගැටලුකාරී තත්ත්වය හමුවේ ඒ පිළිබඳව විමසා බලා වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය, 1 වන වගඋත්තරකාරිය පන්තිභාරකාරීත්වය දැරූ පන්තියෙන් වෙනත් පන්තියකට මාරු කිරීමට සහ විද්‍යාලයේ ගුරුවරුන්හට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන බැවින් මෙම පැමිණිල්ලට අදාළව 2 වන වගඋත්තරකාර අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ හිටපු විදුහල්පති ප්‍රියංක බණ්ඩාර පුරනේගෙදර යන අය හට වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

එසේම, 3 වන වගඋත්තරකාර අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ වර්තමාන විදුහල්පති ටී.එම්.ඩබ්.කේ. තෙන්නකෝන් යන අය මෙම පැමිණිල්ලට අදාළ සිදුවීම් සිදුවන කාලවකවානුවේ දී විද්‍යාලයේ සේවය කර නොමැති බැවින් මෙම පැමිණිල්ලට අදාළව 3 වන වගඋත්තරකාර අම්/දෙහි/ දමුන්නරුව ප්‍රාථමික විද්‍යාලයේ වර්තමාන විදුහල්පති ටී.එම්.ඩබ්.කේ. තෙන්නකෝන් යන අය හට වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

තවද, 4 වන වගඋත්තරකාර දෙහිඅත්තකණ්ඩිය කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යක්ෂ කේ.බී. ධර්මසේන යන අය විසින් මෙම පැමිණිල්ලේ ප්‍රශ්නගත සිදුවීමට අදාළව විමර්ශන කමිටුවක් පත් කර මූලික තොරතුරු සොයා බැලීමක් සිදු කර වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා

යන දැරිය නැවත පාසල් ගත කිරීමට පියවරගෙන ඇති බවටත්, පැමිණිලිකාරිය විසින් මෙම පැමිණිල්ල කොමිෂන් සභාව හමුවේ ගොනු කිරීමෙන් අනතුරුව කරුණු සොයා බැලීමෙන් පසු වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය නැවතත් පාසල් නොයන බවට අනාවරණය වීමෙන් අනතුරුව 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන ගුරුවරිය අම්/දෙහි/ වැවගම ප්‍රාථමික විද්‍යාලය වෙත ස්ථාන මාරු කිරීමට කටයුතු කර ඇති බවටත් පෙනී යන බැවින් මෙම පැමිණිල්ලට අදාළව 4 වන වගඋත්තරකාර දෙහිඅත්තකණ්ඩිය කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යක්ෂ කේ.බී. ධර්මසේන යන අය හට වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

මෙම සිදුවීමට අදාළව දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණයේ අපරාධමය වරදක් සම්බන්ධව 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අයට එරෙහිව නඩුවක් පවතින බව වාර්තා වන හෙයින් ඒ සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් කරනු නොලැබේ. එහෙත් පරිපාලනමය වශයෙන් 1 වන වගඋත්තරකාර ආර්.එම්.පී. සුදර්ශනී යන අය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයන්ට පරිබාහිරව කටයුතු කරමින් වින්දිත පාර්ශවය වන එම්. ගිහංසි සත්සරී පෙරේරා යන දැරිය හිංසනයන්ට ලක් කිරීමට අදාළව පරීක්ෂණයක් පවත්වා සුදුසු විනය පියවර ගැනීමට නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. 07 .16 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -: 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්, - කරුණු දැනගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ලේකම්, - ඉහත නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
ඕර්ස් හිල්, ත්‍රිකුණාමලය.

04. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - කරුණු දැනගැනීම සඳහා
නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ඕර්ස් හිල්, ත්‍රිකුණාමලය.